# පුරවැසි අධ්‍යාපනය
## 10 ශ්‍රේණිය A/B/C/D ශ්‍රේණි සඳහා
## 02 වන පාඩම

**බලය බෙදීම හා විමධ්‍යගත කිරීම**

- බලය යනු :
  යමක් පාලනය කිරීමට, හැසිරීමට ඇති හැකියාවයි.

- බලයේ ස්වරූපය :
  ආගමික බලය
  දේශපාලනය
  ආර්ථික බලය
  සාමාජිය බලය
  පරිපාලන බලය

- බලය විමද්‍යගත කිරීම යනු:
  මධ්‍යම ආණ්ඩුව සතු බලතල පරිපාලනපහසුව සඳහා ප්‍රාදේශීය ඒකකවලට පවරා දීමයි
  උදා : ශ්‍රී ලංකාව

- බලය බෙදීම යනු
  මධ්‍යම ආණ්ඩුව සතු බලතල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන්ම ප්‍රාන්ථ ඒකකවලට බෙදා දීමයි
  උදා: ඇමරිකා එක්සත් ජනපදය, ස්විස්ටර්ලන්තය

**රාජ්‍යක ස්වරූපය**

ඒකීය රාජ්‍ය
සංධීය රාජ්‍ය

- ඒකීය රාජ්‍යයක් යනු :
  කිසියම් රාජ්‍යයක එක් මධ්‍යම ආණ්ඩුවක් මඟින් ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල මෙහෙයවයි නම් එම රටවල් ඒකීය රටවල් ලෙස හඳුන්වයි.
  උදා: ශ්‍රී ලංකාව / මහා බ්‍රිතාන්‍ය

- සංධීය රාජ්‍යයක් යනු:
  මධ්‍යම ආණ්ඩුවට අමතරව පාන්ථ ආණ්ඩු මගින් ව්‍යවස්ථාදායකය, විධායක, අධිකරණ බලතල මෙහෙයවන රටවල් සංධීය රාජ්‍යයක් ලෙස හඳුන්වයි.
  උදා: ඇමරිකා එක්සත් ජනපදය / ස්විස්ටර්ලන්තය

**ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම**

**මධ්‍යම ආණ්ඩුව**

- ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව - 225)
- විධායකය ජනාධිපති ඇතුළු කැබිනට් මණ්ඩලය
- අධිකරණය (අධිකරණ 6)

**ව්‍යවස්ථාදායකය**

මෙය  පාර්ලිමෙන්තුව ලෙසද හඳුන්වයි. එහි සාමාජික ගණන 225 කි. ඉන 196 ක් පර්ලිමේන්තු මහා මැතිවරණයෙන් ද 29 ක් ජාතික ලැයිස්තුවෙන්ද පාර්ලිමේන්තුවට තෝරා පත්කර ගනියි. ව්‍යවස්ථාදායකය සතු බලතල වන්නේ

1. නීති පැනවීම
2. අය වැය පාලනය
3. නීති සම්පාදනය කිරීම
4. විධායක පාලනය කිරීම

විධායකය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාවේ විධායකය ලෙස හඳුන්වනුයේ ජනාධිපති ඇතුළු කැබිනට් මණ්ඩලයේ ජනාධිපතිවරයා වෙනම ජනාධිපතිවරණයකින් තෝරා පත්කර ගනියි. එය වසර 05 කට වරක් පවත්වයි. විධායකය සතු බලතල ලෙස

1. නීති ක්‍රියාත්මක කිරීම
2. මුදල් පාලනය
3. රාජ්‍ය සේවය පාලනය
4. විදේශ කටයුතු

**අධිකරණය**

මෙයට ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රමුඛ අධිකරණ පද්ධතිය ඇතුළත් වේ. අදිකරණය සතු බලතල ලෙස

1. නීති විවරණය කිරීම
2. යුක්තිය සසඳලීම
3. උපදේශන කාර්යයන් ආදිය වේ.

**පළාත් සභා**

ශ්‍රී ලංකාවේ පළාත් සභා ගණන 09 කි. (දිස්ත්‍රික්ක ගණන 25 කි)

1. උතුරු පළාත
2. උතුරු මැද පළාත

3. නැගෙනහිර පළාත
4. වයඹ පළාත
5. මධ්‍යම පළාත
6. බස්නාහිර පළාත
7. ඌව පළාත
8. සබරගමුව පළාත
9. දකුණු පළාත

- 1987 දී 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව පළාත් සභා පිහිටුවා ඇත.

**පළාත් සභාවේ ව්‍යුහය**




**පළාත් සභාවක බලතල බෙදා ඇති අයුරු**
(ලැයිස්තු 03 ක් යටතේ)

1. ලැයිස්තුව - පළාත් සභා බලතල
2. ලැයිස්තුව - සංවෘත බලතල
3. ලැයිස්තුව - සමගාමී බලතල

**පළාත් පාලන ආයතන**

වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන ගණන 03 කි.
1. මහ නගර සභා (23)
2. නගර සභා (41)
3. ප්‍රාදේශීය සභා (271)

**පළාත් පාලන ආයතන සතු බලතල හා කාර්යයන්**

- පොදු මංමාවත් කටයුතු
  - උදා: මාර්ග තැනීම
  - මාර්ග පිරිසිදු කිරීම
  - මහා මාර්ග නඩත්තුව
  - අතුරුමාර්ග ඉදිකිරීම්
- මහජන සෞඛ්‍ය කටයුතු
  - උදා: කානු ඉදිකිරීම
  - මහජන සෞඛ්‍ය කටයුතු
  - මල පවාහන පද්ධති අලුත්වැඩියාව
- පොදු උපයෝගිතා කටයුතු
  - උදා: වෙළඳපලවල්
  - ක්‍රීඩාපිටි
  - පුස්තකාල
  - උයන්වතු

**පළාත් පාලන ආයතනවල ව්‍යුහය**

මහනගර සභා / නගරසභා

↓

පුරපති / නගරාධිපති

↓

උප නගරාධිපති

↓

සභාව

↓

- පක්ෂ මන්ත්‍රී
- විපක්ෂ මන්ත්‍රී